# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report
# 2017

## කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
## முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
## DEPARTMENT OF MANAGEMENT AUDIT

| | | |
|---|---|---|
| මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு | Ministry of Finance and Mass Media |
| මහලේකම් කාර්යාලය | செயலகம் | The Secretariat |
| කොළඹ 01. | கொழும்பு 01. | Colombo 01. |

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

මහලේකම් කාර්යාලය

*රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හි උපදෙස්වලට අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.*

**කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව**

**මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**මහලේකම් කාර්යාලය**

**කොළඹ 01.**

# පටුන

**පිටු අංකය**


01. දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්යයන් 01

1.1. දැක්ම 01

1.2. මෙහෙවර 01

1.3. අරමුණු 01

1.4. කාර්යයන් 02

02. මූල්‍ය පරිපාලනය 03

03. භෞතික කාර්ය සාධනය 05

3.1 රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීම 05

3.2 විගණන හා කළමනාකරණ කමිටු සඳහා නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම 07

3.3 සංවර්ධන ව්‍යාපෘතිවල කළමනාකරණ විගණනය ශක්තිමත් කිරීම 09

3.4 විශේෂ විමර්ශන හා විගණන කටයුතු 10

3.5 රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත මහා භාණ්ඩාගාර වාර්තා ඉදිරිපත් කිරීම 13

04. මානව සම්පත් සංවර්ධනය හා සාමාන්‍ය පරිපාලනය 14

4.1 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 14

4.2 2017.12.31 දිනට කාර්ය මණ්ඩලය 15

4.3 2017 වර්ෂයේ පුහුණු හා හැකියා වර්ධන කටයුතු 16

4.3.1 2017 වර්ෂයේ විදේශීය පුහුණු අවස්ථා 16

4.3.2 2017 වර්ෂයේ දේශීය පුහුණු අවස්ථා 18

4.3.3 2018 වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම් 20

# 01. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ දැක්ම , මෙහෙවර , අරමුණු හා කාර්යයන්

## 1.1 දැක්ම

ඉහළම කාර්ය සාධනයකින් හා වගවීමකින් යුත් රාජ්‍ය සේවයක් උදෙසා වටිනාකම් එකතු කරන විශිෂ්ඨතම කළමනාකරණ විගණන කොටස්කරු බවට පත්වීම.

## 1.2 මෙහෙවර

කළමනාකරණ විගණනය තුලින් රාජ්‍ය සේවයේ වගවීම ඉහළ නැංවීම හා වටිනාකම් එකතු කිරීම සඳහා ස්වාධීන හා අරමුණු කරා ළඟාවීම සහතික කෙරෙන උපදේශාත්මක සේවා සැපයීම.

## 1.3 අරමුණු

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයෙහි ඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා දායකවීම.
2. විගණන හා කළමනාකරණ කමිටු මගින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම.
3. කළමනාකරණ විගණනය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හඳුන්වා දීම.
4. සංවර්ධන ව්‍යාපෘතීන්හී කළමනාකරණ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
5. විශේෂ විමර්ශන කටයුතු තුලින් රාජ්‍ය අංශයේ සිදුවන හා සිදුවිය හැකි අක්‍රමිකතා අනාවරණය කිරීම හා එවැනි තත්ත්වයන් හා සිදුවීම් වළක්වා ගැනීමට නිර්දේශයන් සහ නිවාරණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

## 1.4 කාර්යයන්

2008.01.25 දිනැති අංක. 08/0200/306/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවක් ලෙස 2008.02.01 දින ස්ථාපනය කර ඇත. ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් හා ගණන්දීමේ නිලධාරින්ට භාණ්ඩාගාරයෙන් ලැබෙන සහාය තවදුරටත් ශක්තිමත් කිරීම එහි අරමුණ වී ඇති අතර, ඒ අනුව අමාත්‍යාංශ හා අමාත්‍යාංශ යටතේ ස්ථාපිත කර ඇති ස්වාධීන ආයතන හා දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන අංශවලට මඟ පෙන්වීමත්, එමගින් එම කටයුතු ශක්තිමත් කිරීමත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරේ.

තව ද මෙම දෙපාර්තමේන්තුව 2017.06.09 දිනැති අංක 2022/34 ගැසට් පත්‍රයෙන් ජනාධිපති කාර්යාලය යටතට පත්ව ඇති අතර, ඉහත විෂය පථයේ කිසිදු වෙනසක් සිදුවී නොමැත.

### කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්යයන් :

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයේ ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.

2. අමාත්‍යාංශ, විශේෂ වියදම් ඒකක සහ විශේෂ දෙපාර්තමේන්තු යටතේ ඇති සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණ විගණනය අධීක්ෂණය කිරීම.

3. අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ හඳුන්වාදීම.

4. අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධීකරණය හා අවශ්‍ය මගපෙන්වීම් කිරීම.

5. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ අභ්‍යන්තර විගණන කුසලතා දියුණු කිරීම.

6. අමාත්‍යාංශ හා විශේෂ වියදම් ඒකක වල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා මඟපෙන්වීම.

7. විශේෂ විමර්ශන කටයුතු සිදුකිරීම.

8. රජයේ ගිණුම් කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ භාණ්ඩාගාර වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම.

# 02. මූල්‍ය පරිපාලනය

2017 අයවැය ඇස්තමේන්තුව මගින් වැය ශීර්ෂ 324 වැඩසටහන අංක 01 ව්‍යාපෘතිය - අංක 01 යටතේ මෙම දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබිණි.

2017.12.31 දින දක්වා එම ප්‍රතිපාදන වැය කළ ආකාරය පහත දැක්වේ.

| වියදම් විස්තරය | සංශෝධිත ඇස්තමේන්තු වෙන්කිරීම (රු.) | අමතර ප්‍රතිපාදන වෙන්කිරීම (රු.) | මු.රෙ. 66 හා 69 අනුව මාරු කිරීම් (රු.) | සත්‍ය වියදම (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම් (අ)** | **43,834,000** | **3,077,000** | **617,000<br>-617,000** | **43,574,687** | **3,336,313** |
| පුද්ගල පඩිනඩි | 33,200,000 | 0 | | 30,490,288 | 2,709,712 |
| අනෙකුත් වියදම් | 10,634,000 | 3,077,000 | | 13,084,398 | 626,602 |
| උප එකතුව | **43,834,000** | **3,077,000** | **0** | **43,574,687** | **3,336,313** |
| **මූලධන වියදම් (ආ)** | **4,900,000** | **-** | | **2,338,778** | **2,561,222** |
| | | | | | |
| 2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,000,000 | - | | 28,500 | 1,971,500 |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා | 200,000 | - | | 69,950 | 130,050 |
| 2102 ලීබඩු හා කාර්යාලීය උපකරණ | 400,000 | - | | 175,215 | 224,785 |
| 2103 යන්ත්‍ර හා උපකරණ | 1,700,000 | - | | 1,505,101 | 194,899 |
| 2401 හැකියා වර්ධනය | 600,000 | - | | 560,012 | 39,988 |
| මුළු එකතුව (අ) + (ආ) | **48,734,000** | **3,077,000** | **0** | **45,913,465** | **5,897,535** |






## රජයේ නිලධරයන්ගේ අත්තිකාරම් 'බී ' ගිණුම

2017 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අනුමත අත්තිකාරම් 'බී 'ගිණුමේ විස්තර පහත දැක්වේ.

| විස්තරය | අනුමත සීමාව (රු.) | තත්‍ය වියදම (රු.) |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | 4,500,000 | 4,102,837.80 |
| අවම ලැබීම් සීමාව | 2,000,000 | 2,650,586.58 |
| උපරිම හර ශේෂ සීමාව | 10,000,000 | 7,920,448.34 |

# 03. භෞතික කාර්ය සාධනය

## 3.1 අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීම

අභ්‍යන්තර විගණයෙන් අපේක්ෂිත පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්තව සිටින අභ්‍යන්තර විගණකවරුන්, සංවර්ධන නිලධාරීන් සහ එම අංශ වල රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන්ගේ වෘත්තීය දැනුම ඉහළ නැංවීමට හා විගණනය පිළිබඳව කාලීන තොරතුරු ලබාදීමට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව නිරතුරුවම කටයුතු කරයි.

උක්ත අරමුණ සහිතව 2017.12.31 දින දක්වා මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් වැඩමුළු පවත්වන ලදී.

| පැවැත්වූ දිනය | වැඩමුළුවේ මාතෘකාව | සහභාගී වූ අය |
|---|---|---|
| 2017.03.03/04 | කාර්ය මණ්ඩල අභිප්‍රේරණ වැඩමුළුව | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ සියළුම කාර්ය මණ්ඩලය |
| 2017.05.09 | අභ්‍යන්තර විගණනය සඳහා වූ ජාත්‍යන්තර වෘත්තිමය මගපෙන්වීම් රාමුව<br>විගණකාධිපතිගේ කාර්යභාරය හා අභ්‍යන්තර විගණනය | මුදල් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන අංශයේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිළධාරීන් |
| 2017.06.07 | විගණකාධිපතිගේ බලතල හා වගකීම්<br>CIGAS හා GPS සඳහා අභ්‍යන්තර විගණනය හා ආයතනික චර්යාව | අමාත්‍යාංශ 16 ක් නියෝජනය කරන අභ්‍යන්තර විගණන අංශවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිළධාරීන් |
| 2017.06.13 | තොරතුරු දැනගැනීමේ පනත හා ඒ යටතේ වන විගණකගේ කාර්යභාරය | අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විශේෂ වියදම් ඒකකවල අභ්‍යන්තර විගණකවරුන් |
| 2017.07.05 | ව්‍යාපෘති මෙහෙයුම් ඒකක විගණනය | අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විශේෂ වියදම් ඒකකවල අභ්‍යන්තර විගණකවරුන් |
| 2017.07.10 | විගණක නොවන නිලධාරීන් සහ අභ්‍යන්තර විගණනයේ වැදගත්කම | අමාත්‍යාංශවල විගණන හා ගිණුම් කටයුතු වලට සම්බන්ධ නොවන විධායක ශ්‍රේණියේ නිලධාරීන් |

| | | |
|---|---|---|
| 2017.07.19 | අභ්‍යන්තර විගණනය සහ විගණන හා කළමනාකරණ කමිටු<br>විගණකාධිපතිගේ කාර්යභාරය හා අභ්‍යන්තර විගණනය | අමාත්‍යාංශ 12 ක් නියෝජනය කරන අභ්‍යන්තර විගණන අංශවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිළධාරීන් |
| 2017.08.30 | අභ්‍යන්තර විගණන මූලධර්ම, කාර්යයන් සහ පරිගණක ආශ්‍රිත ක්‍රියාවලි විගණනය | අමාත්‍යාංශ 09 ක් නියෝජනය කරන අභ්‍යන්තර විගණන අංශවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිළධාරීන් |
| 2017.10.03 | අභ්‍යන්තර විගණන මූලධර්ම, කාර්යයන් සහ පරිගණක ආශ්‍රිත ක්‍රියාවලි විගණනය | දිස්ත්‍රික් ලේකම් කාර්යාල 05 ක් හා දෙපාර්තමේන්තු 04ක් නියෝජනය කරන අභ්‍යන්තර විගණන අංශවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිළධාරීන් |
| 2017.10.12 | අභ්‍යන්තර විගණන මූලධර්ම, කාර්යයන් සහ පරිගණක ආශ්‍රිත ක්‍රියාවලි විගණනය | අමාත්‍යාංශ 12 ක් නියෝජනය කරන අභ්‍යන්තර විගණන අංශවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිළධාරීන් |
| 2017.10.30 | අභ්‍යන්තර විගණන මූලධර්ම, කාර්යයන් සහ පරිගණක ආශ්‍රිත ක්‍රියාවලි විගණනය | අමාත්‍යාංශ 03 ක් දෙපාර්තමේන්තු 10 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 01ක් නියෝජනය කරන අභ්‍යන්තර විගණන අංශවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිළධාරීන් |
| 2017.12.11 - 2017.12.12 | රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සහ සංවර්ධන නිලධාරීන් සඳහා වන අභ්‍යන්තර විගණනය සඳහා වන පුහුණු වැඩසටහන | උතුරු නැගෙනහිර පළාත් වලට අයත් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි අභ්‍යන්තර විගණන අංශවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සහකාර සේවයේ කාර්ය මණ්ඩලය |
| 2017.12.18- 2017.12.19 | විගණන සැලැස්ම සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය සියළු අමාත්‍යාංශ, කොමිෂන් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ දෙපාර්තමේන්තු වල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභන්තර විගණකවරුන් |

තවද, උක්ත වැඩසටහන් වලට අමතරව ඇමරිකා එක්සත් ජනපද ආධාර වැඩසටහන යටතේ (USAID) ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සඳහා පහත පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

| පැවැත් වූ දිනය | වැඩමුළුවේ මාතෘකාව | සහභාගී වූ අය |
|---|---|---|
| 2017.06.27 - 2017.06.29 | ව්‍යෝහාරික විගණනය (Forensic Audit) | අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විශේෂ වියදම් ඒකකවල අභ්‍යන්තර විගණකවරුන් |
| 2017.08.14 - 2017.08.16 | තොරතුරු තාක්ෂණ පද්ධති විගණනය | අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විශේෂ වියදම් ඒකකවල අභ්‍යන්තර විගණකවරුන් |
| 2017.10.16 - 2017.10.19 | ප්‍රසම්පාදන විගණනය | අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විශේෂ වියදම් ඒකකවල අභ්‍යන්තර විගණකවරුන් |
| 2017.11.21 - 2017.11.23 | කාර්යසාධන විගණනය | ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, සියළු අමාත්‍යාංශ, කොමිෂන් සභා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ දෙපාර්තමේන්තුවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් හා අභන්තර විගණකවරුන් |

## 3.2 විගණන හා කළමනාකරණ කමිටු සඳහා භාණ්ඩාගාර නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරිම

රජයේ අමාත්‍යාංශ, විශේෂ දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි විගණන හා කළමනාකරණ කමිටු සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිත මෙන්ම කමිටු සාමාජිකයෙකු වශයෙන් මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වේ. එම නිලධාරීන් විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ඵලදායීව හා අඛණ්ඩව පැවැත්වීම පිළිබඳ මාර්ගෝපදේශ සැපයීම හා අධීක්ෂණය කිරීම් සිදුකර ඇත. එමෙන්ම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක ශක්තිමත් කිරීමටත්, අභ්‍යන්තර විගණන වාර්තා හා රජයේ විගණන විමසුම් වලින් පෙන්වා දී ඇති විශේෂ කරුණු සම්බන්ධව තීරණ ගැනීමේදී අවශ්‍ය උපදෙස් ලබාදීමටත් කටයුතුකර ඇත. තවද කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසුවිපරම් කිරීම මගින් රාජ්‍ය අංශයේ කළමනාකරණ කටයුතු ශක්තිමත් කිරීමට දායකත්වය සපයා ඇත.

කළමනාකරණ විගණන චක්‍රලේඛ විධිවිධාන අනුව 2017.12.31 දිනට අමාත්‍යාංශ 51 ක පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 191 කටද, විශේෂ දෙපාර්තමේන්තු 07 ක පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 30කට ද, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව හා මැතිවරණ කොමිෂන් සභාව යන විශේෂ වියදම් ඒකකවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 21කට ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 14ක විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 19කට ද, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 01කට ද මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වී ඇත.

### 3.2.1 රාජ්‍ය අංශයෙහි අභ්‍යන්තර විගණනයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම.

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනයන්හි අභ්‍යන්තර විගණනය විධිමත්ව පවත්වාගෙනයාමේ අරමුණින් අභ්‍යන්තර විගණන ඒකක දැනටමත් පිහිටුවා ඇත. එම අභ්‍යන්තර විගණන ඒකකවල ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වර්ධනය සහ වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකක සමීපව සුපරීක්ෂණය කිරීම කාලීන අවශ්‍යතාවයක් බව හඳුනා ගනු ලැබූ අතර, ඒ අනුව එහි පළමු අදියර යටතේ අමාත්‍යාංශවල අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය 2017 වර්ෂයේ අවසාන කාර්තුවේදී මෙම දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කෙරිණි.

මේ යටතේ අමාත්‍යාංශ 45ක අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය සිදු කෙරුණු අතර, එමඟින් පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට අවස්ථාව උදා විය.

I. සියළු අමාත්‍යාංශ වල අභ්‍යන්තර විගණන කටයුතු ඒකීය ක්‍රමයක් යටතේ පවත්වාගෙන යාමට හැකිවීම.
II. මෙම දෙපාර්තමේන්තුව හා සියළු අමාත්‍යාංශවල අභ්‍යන්තර විගණන අංශ අතර සම්බන්ධීකරණ කටයුතු වර්ධනය කිරීම.
III. විගණන කටයුතු සිදුකර ගෙනයාමේදී අභ්‍යන්තර විගණකහට මුහුණපෑමට සිදුවන ගැටළු බාධක නිවැරදිව හඳුනාගැනීමට හැකි වීම.
IV. අභ්‍යන්තර විගණන සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ලබාදීමට හැකිවීම.

මෙම සමාලෝචනයේදී අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම හා සංයුතිය, විගණන වාර්තා ඉදිරිපත් කිරීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, විශේෂ විමර්ශන පැවැත්වීම, අභ්‍යන්තර පාලනය හා රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම යන ප්‍රධාන ශීර්ෂයන් ඔස්සේ අභ්‍යන්තර විගණනයේ කාර්ය සාධනය සමාලෝචනය සිදු කෙරුණු අතර, ඒ මඟින් පහත සඳහන් අඩුපාඩු හඳුනාගන්නා ලදී.

a) ඇතැම් අභ්‍යන්තර විගණන අංශවල සහායක කාර්ය මණ්ඩලය සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති වීම හා කාර්ය මණ්ඩලය සඳහා භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම.
b) ඇතැම් ක්ෂේත්‍ර සම්බන්ධ තාක්ෂණික විෂය දැනුම ප්‍රමාණවත් නොවීම.
c) අභ්‍යන්තර විගණන රාජකාරී කටයුතුවලට පරිබාහිරව වෙනත් රාජකාරී කටයුතුද පවරා තිබීම හා බාහිර බලපෑම් ඇති වීම.
d) විගණකාධිපති විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදුකිරීම.
e) විගණනය සම්බන්ධයෙන් ඉහළ කළමනාකරණයේ ඇති ආකල්ප යහපත් නොවීම.
f) අමාත්‍යාංශය යටතේ ඇති ඇතැම් රාජ්‍ය ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක කැඳවීමට කටයුතු නොකිරීම.

මෙම සමාලෝචන රැස්වීම් මඟින් අභ්‍යන්තර විගණන ඒකකවල ඵලදායිතාවය ඉහළ නැංවීමට දායක වන බැවින් 2018 වර්ෂයේ සිට අමාත්‍යාංශවල මෙන්ම දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලද අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය සිදුකිරීමට සැලසුම් කර ඇත.

## 3.3 සංවර්ධන ව්‍යාපෘතිවල කළමනාකරණ විගණනය ශක්තිමත් කිරීම.

සියළු අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති වල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරමින් සිටී. ඒ අනුව ඩොලර් මිලියන 10 ට වඩා වැඩි විදේශාධාර පාදක, සංවර්ධන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරු බඳවා ගැනීම බලගන්වමින් නිකුත් කරන ලද චක්‍රලේඛය යටතේ සංවර්ධන ව්‍යාපෘති 12ක පමණ අභ්‍යන්තර විගණකවරුන් මේ වන විට බඳවාගෙන ඇති අතර ව්‍යාපෘති 13ක් සඳහා බඳවා ගැනීම් කටයුතු කරමින් පවතින බව වාර්තා වී ඇත.

එමෙන්ම එකී අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්ය කර්තව්‍ය හා වගකීම් හඳුන්වා දෙමින් කළමනාකරණ විගණන චක්‍රලේඛ 1/2017 මාර්ගෝපදේශ චක්‍රලේඛය නිකුත් කර ඇත. ඊට අමතරව අඛණ්ඩව සංවර්ධන ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණන කටයුතු අධීක්ෂණය කරමින් ඒවායේ දුර්වලතා අවම කර ගැනීමට අවශ්‍ය පෙළඹවීම් මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලැබේ.

එසේම සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව පහත සඳහන් විශේෂ විමර්ෂණ කටයුතු ද දැනට මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරගෙන යනු ලැබේ.

- කොළඹ දකුණු වරාය සංවර්ධන ව්‍යාපෘතියේ වාහන අවභාවිතය පිළිබඳ විමර්ශනයක් කරමින් පවතී.
- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම පරිදි එම අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියට අදාළව කළමනාකරණ විගණනය මෙම දෙපාර්තමේන්තුව මඟින් ඉටුකරමින් පවතී.

## 3.4 විශේෂ විමර්ශන හා විගණන කටයුතු

මුදල් අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා වෙත මෙන්ම මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන පැමිණිලි මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ නියමය පරිදි පරික්ෂා කර වාර්තා කිරිම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබයි. එසේ යොමු කරනු ලදුව ඉටුකරන ලද පරික්ෂණයන්ගේ වාර්තාවක් භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ අදාල ආයතනයේ ප්‍රධානීන්හට යොමු කරනු ලබන අතර විමර්ශනය අනුව හෙළිදරව් වන අඩුපාඩු සහ අක්‍රමිකතා නැවත සිදුවීම වලක්වා ගැනීම මෙහි අරමුණ වේ.

2017 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විටදී කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මගින් විමර්ශන කටයුතු අවසන් කර ඇති මුළු විමර්ශන සංඛ්‍යාව 19 ක් වන අතර, මෙම කාලපරිච්ඡේදය තුළ ඉදිරිපත් වු පැමිණිලි 21ක් සඳහා තවදුරටත් විමර්ශන සිදුකරමින් පවතී.

### 2017.12.31 දිනට අවසන් කර ඇති විශේෂ විමර්ශන

| අනු අංකය | ආයතනය | විමර්ශනය |
|---|---|---|
| 1 | Gymkhana Club | මත්පැන් විකිණීම සඳහා වු බලපත්‍රය අවභාවිතා කිරීම. (Misused of Liquor License) |
| 2 | කදුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | සෞම්‍යමූර්ති තොණ්ඩමන් පදනමේ සිදුවී ඇති දූෂණ |
| 3 | අංක 05 දේවාල පටුමඟ - කෝට්ටේ | දේවාල පටු මගෙහි අනවසර ඉදි කිරීමක් සම්බන්ධව |
| 4 | අවිස්සාවේල්ල මහජන බැංකුව | උකස් තබන ලද රත්‍රං වංචනික ලෙස අස්ථාන ගත කිරීම. |
| 5 | දුම්රිය දෙපාර්තමේන්තුව | රජයේ මුදල් අවභාවිතා කිරීම |
| 6 | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව | දෙපාර්තමේන්තුවේ තැගි මුදල් නොගෙවීම |
| 7 | ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව | දෙපාර්තමේන්තුවේ වර්තමාන පරිපාලනය පිළිබඳ |
| 8 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | රාජ්‍ය මුදල් එලදායීතාවයෙන් තොරව වියදම් කිරීම |
| 9 | නුවරඑළියේ පොලිස් අධිකාරි කාර්යාලය | ගණකාධිකාරී මුදල් වංචා කිරීම |

| | | |
|---|---|---|
| 10 | ජාතික රක්ෂණභාර අරමුදල | අරමුදලේ කටයුතු පිලිබඳ |
| 11 | රජයේ නිලධාරින්ගේ යහසාධක සංගමය | 107 වැනි මහ සභා රැස්වීම හා නිලවරණය |
| 12 | මුදල් අමාත්‍යාංශය | මුදල් අමාත්‍යාංශයේ KU-0392 වාහනයේ අවභාවිතය පිළිබඳව |
| 13 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | නවක සේවකයින් බඳවා ගැනිමේදී හා අභ්‍යන්තර උසස්වීම් වලදී සිදු වූ අක්‍රමිකතා |
| 14 | දූෂණ විරෝධි පෙරමුණ | නිලවාහන හිමි නිලධාරින් සංචිත වාහන භාවිතා කිරිම |
| 15 | සමන්ත රුක්ෂාන් ජයවික්‍රම මයා - මාතර | වංචනිකව විශ්‍රාම වැටුප් ලබාගැනීම පිළිබඳව |
| 16 | තක්සේරු දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා තක්සේරු ආයතනයේ යෝජිත ව්‍යවස්ථාව සංශෝධන ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවිම. |
| 17 | South Eastern University of Sri Lanka | Corruption from South Eastern University of Sri Lanka (Special Investigation on Foreign Training and Seminars in SEUSL) |
| 18 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | බොරු චෝදනා මත වැඩ තහනම් කිරීම සහ බේරුවලට මාරු කිරීම. |
| 19 | වරාය අධිකාරිය | කොළඹ වරායේ එඩිසන් තීරුබදු රහිත සාප්පු සංකීර්ණය |

## 2017.12.31 දින දක්වා ලැබී ඇති තවදුරටත් සිදුකරමින් පවතින විමර්ශන

| අනු අංකය | ආයතනය | කාරණය |
|---|---|---|
| 1 | රේගු දෙපාර්තමේන්තුව | රත්තරන් කි.ලෝ. 03 ක් සම්බන්ධව විමර්ෂණ |
| 2 | තැපැල් දෙපාර්තමේන්තුව | දිවයිනේ සියළුම තැපැල් අංශවල දූෂණයන් |
| 3 | තැපැල් දෙපාර්තමේන්තුව | 1. වංචනිකව සිදුවන රාජ්‍ය මුදල් ගසාකෑම<br>2. අනුරාධපුර තැපැල් කාර්යාලයේ දුර්වල පරිපාලනය<br>3. මුදල් අවභාවිතය |
| 4 | ජාතික විද්‍යා සභාව | රාජ්‍ය මුදල් අයථා පරිහරණය |
| 5 | ලංකා පුත්‍ර බැංකුව | ලංකා පුත්‍ර බැංකුවේ හම්බන්තොට ශාඛාවේ සිදු වී ඇති මූල්‍ය වංචා හා අක්‍රමිකතා |

| | | |
|---|---|---|
| 6 | තැපැල් දෙපාර්තමේන්තුව යාපනය | යාපනය තැපැල් කාර්යාලයේ අක්‍රමිකතාවයන් |
| 7 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | විමර්ශන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් සම්බන්ධව |
| 8 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | ලේඛකාධිකාරිගේ දූෂණ හා වංචා පිළිබඳව |
| 9 | පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | වංචාකාර වැඩ |
| 10 | කොළඹ වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | ව්‍යාපෘතියට ගෙන එන ලද යන්ත්‍ර හා වාහන ව්‍යාජ ලෙස අලෙවි කිරීම |
| 11 | ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | ජනතාවගේ මුදල් අයතා ලෙස ගසා කෑම/ අවභාවිතය |
| 12 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | කෑගල්ල ප්‍රාදේශීය ආදායම් කාර්යාලයේ ආදායම් ගෙවීමට නියමිත ව්‍යාපාරිකයින්ගේ ලිපිගොනු මුදල් ලබාගෙන ආයතනයෙන් ඉවත් කිරීම. |
| 13 | පෞද්ගලික සෞඛ්‍ය නියාමන සභා | මහජන මුදල් අවභාවිතය සහ බදු මුදල් පැහැර හැරීම පිළිබඳ පැමිණිල්ල |
| 14 | ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය | නිල වාහන හිමිකම් නොලත් නිලධාරීන් විසින් වාහන දීමනා ලබාගෙන සිදුකරන රාජ්‍ය මුදල් අවභාවිතය පිළිබඳ |
| 15 | රේගු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා නිදහස් වෘත්ති සමිති සංගමය | උසාවි නඩු අංක -AR-82/2017/(B)193/(17)<br>රේගු ලිපි ගොනු අංකය -CIB/INV/108/2016 |
| 16 | Custom Department | Under Valuation of Vehicle |
| 17 | සුරාබදු දෙපාර්තමේන්තුව | ප්‍රධාන සුරාබදු පරීක්ෂක සම්බන්ධව |
| 18 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | නිති රීති උල්ලංඝණය කරමින් ක්‍රියා කිරීම |
| 19 | වතු යටිතල පහසුකම් හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය | නිසි ප්‍රසම්පාදන ක්‍රමවලින් තොරව භාණ්ඩාගාර මුදල් අවභාවිතය |
| 20 | කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනය | දූෂණ අක්‍රමිකතා හා රාජ්‍ය මුදල් අවභාවිතය |
| 21 | නගර සැලසුම් හා ජල ප්‍රවාහන අමාත්‍යාංශය | දූෂණ අක්‍රමිකතා |

මෙම විමර්ශන කටයුතු 2017 වර්ෂය තුල අවසන් කිරීමට නොහැකි වුවත්, ඒවායින් වැඩි ප්‍රමාණයක් අවසන් අදියර දක්වා නිමකර ඇත.

**2017.12.31 දිනට සිදුකර අවසන් විශේෂ විගණන කටයුතු**

1. වැටුප් සකස් කිරීම හා ගෙවීම සඳහා හඳුන්වා දෙන ලද නව පරිගණක වැඩසටහන - තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව
2. මුදල් අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල විදේශ පුහුණුවීම් -මුදල් අමාත්‍යාංශය

**2017.12.31 දිනට සිදු කරමින් පවතින විශේෂ විගණන කටයුතු**

1. මත්පැන් නිෂ්පාදන වෙළඳාම සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සම්බන්ධ විශේෂ විගණනය
2. 2016 වර්ෂයේ ජනරජ ගිණුම විගණනය කිරීම

## 3.5 රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත මහා භාණ්ඩාගාර වාර්තා ඉදිරිපත් කිරීම.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතන කැඳවීම් කරනු ලබන අවස්ථාවලදී, ඒ ඒ ආයතනවලට අදාලව මහා භාණ්ඩාගාර වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ඒ අනුව 2017.12.31 දින වන විට ඉදිරිපත් කරන ලද වාර්තා ගණන 49ක් වන අතර, එම කාරක සභා රැස්වීම් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ සහභාගීත්වය ද ලබාදී ඇත.

# 04. මානව සම්පත් කළමනාකරණය හා සාමාන්‍ය පරිපාලනය

## 4.1 2017.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය




කා.සේ.සේ. – 6 රියදුරු - 2

* ප්‍ර.රා.ක.ස. - ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර * සං.නි. - සංවර්ධන නිලධාරී * රා. ක.ස. - රාජ්‍ය කළමනාකරණ සහකාර

## 4.2 කාර්ය මණ්ඩලය

### 2017.12.31 දිනට කාර්ය මණ්ඩලය

| තනතුර | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ප.සේ.) | 01 | 00 | 01 |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ග.සේ.) | 05 | 04 | 01 |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ක්‍ර.සේ.) | 02 | 02 | - |
| සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ග.සේ.) | 07 | 06 | 01 |
| පර්යේෂණ සහකාර / සංවර්ධන නිලධාරී | 09 | 06 | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 14 | 11 | 03 |
| රියදුරු | 07 | 02 | 05 |
| කා.සේ.සේ. | 06 | 06 | 00 |
| එකතුව | **53** | **39** | **14** |

## 4.3 2017 වර්ෂයේ පුහුණු හා හැකියා වර්ධන කටයුතු

### 4.3.1 2017 වර්ෂයේ විදේශීය පුහුණු අවස්ථා

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | කාලසීමාව | පුහුණු වැඩසටහන | පුහුණුව ලද රට |
|---|---|---|---|---|---|
| 01 | Mrs. M.A.K.P. Wijewantha | Director | 22.01.2017 - 29.01.2017 | Programme on Public Sector Leadership and Decision Making | Singapore |
| 02 | Mrs. B.T.N. Mali | Assistant Director | 22.01.2017 - 29.01.2017 | Programme on Public Sector Leadership and Decision Making | Singapore |
| 03 | Mrs. K.A.M. Kapurubandara | Deputy Director | 13.02.2017 – 17.02.2017 | Programme on Strategic Human Resource Management | Singapore |
| 04 | Mr. S.M. Dayaratne | Director | 20.02.2017 – 26.02.2017 | Programme on Negotiation and Conflict Resolution | Singapore |
| 05 | Mr. D.G.G.S. Dayanath | Director | 20.02.2017 – 26.02.2017 | Programme on Negotiation and Conflict Resolution | Singapore |
| 06 | Mrs. J. H. Fernando | Deputy Director | 20.02.2017 – 26.02.2017 | Programme on Negotiation and Conflict Resolution | Singapore |
| 07 | Mr.R.R.K.Nugapitiya | Director | 18.03.2017- 27.03.2017 | Training program on Strengthening Public Policy Making Process | Australia |

| | | | | | |
|---|---|---|---|---|---|
| 08 | Mr. S.M. Dayaratne | Director | 17.03.2017 - 06.04.2017 | Seminar on Chinas Experience in Reform & Opening –up for Developing Countries | China |
| 09 | Ms. K.P.G.U. Kariyawasam | Assistsnt Director | 09.04.2017 - 29.04.2017 | Programme on Public Audit Management | Korea |
| 10 | Mrs. M.A.K.P. Wijewantha | Director | 15.05.2017 - 26.05.2017 | Seminar on Economic Cooperation for South Asian | China |
| 11 | Mrs. J. H. Fernando | Deputy Director | 20.05.2017 - 06.06.2017 | Alcohol Distribution Management and Promotion for Countries along the Silk Road Economic Belt 2017 | China |
| 12 | Ms. R.B. Gankewala | Director | 31.05.2017 - 24.06.2017 | Seminar on Financial Service and Cooperation for Developing Countries | China |
| 13 | Mr. A.N. Hapugala | Director | 15.08.2017 - 26.08.2017 | Seminar on Financial Service for China Development Assistance Project for Asian Countries | China |
| 14 | Mr. M.R.G.A.B. Muthukude | Director | 15.08.2017 - 26.08.2017 | Seminar on Financial Service for China Development Assistance Project for Asian Countries | China |

| | | | | | |
|---|---|---|---|---|---|
| 15 | Mr. A.N. Hapugala | Director | 14.11.2017 – 26.11.2017 | 2nd Country Study tour of Diploma in Public Procurement and Contract Administration (Miloda) | U.K. |
| 16 | Mrs. J. H. Fernando | Deputy Director | 14.11.2017 – 26.11.2017 | 2nd Country Study tour of Diploma in Public Procurement and Contract Administration (Miloda) | U.K. |

## 4.3.2 2017 වර්ෂයේ දේශීය පුහුණු අවස්ථා

| අනු අංකය | පුහුණු පාඨමාලාව/වැඩසටහන | මෙහෙයවූ ආයතන | පැවැත්වූ දිනය/දිනයන් | සහභාගීවූ නිලධාරීන්ගේ නම් සහ තනතුරු |
|---|---|---|---|---|
| 01 | Programme on Risk Based IT Auditing | ශ්‍රී ලංකා මහ බැංකුව<br>සී. බී. එස් . ආයතනය | 2017.04.06 - 07 | එම්.ඒ.කේ.පී. විජේවන්ත මිය - අධ්‍යක්ෂ<br>ඩබ්. විමලසේන මයා - අධ්‍යක්ෂ<br>ඩී.ජී.ජී.එස්. දයානාත් මයා - අධ්‍යක්ෂ<br>කේ.ඒ.එම්. කපුරුබණ්ඩාර මිය - නි./අධ්‍යක්ෂ<br>ඩබ්.එම්.ඩී. විජේබණ්ඩාර මයා - සහකාර අධ්‍යක්ෂ |
| 02 | Diploma in Public Procurement and Contract Administration (DIPPCA) | මිලෝදා ආයතනය (Miloda) | 2017<br>පාඨමාලාව හදාරමින් සිටී. | ඒ.එන්. හපුගල මයා - අධ්‍යක්ෂ<br>ජේ.එච්. ප්‍රනාන්දු මිය - නි/ අධ්‍යක්ෂ<br>එම්.ඒ.කේ.පී. විජේවන්ත මිය - අධ්‍යක්ෂ<br>එස්.එම්. දයාරත්න මයා- අධ්‍යක්ෂ |

| | | | | |
|---|---|---|---|---|
| 03 | Diploma in English for Professionals (DEP) | මිලෝදා ආයතනය | 2017 අප්‍රේල් සිට (අවුරුදු 01)<br><br>පාඨමාලාව හදාරමින් සිටී. | ඩබ්. විමලසේන මයා - අධ්‍යක්ෂ<br><br>ඩබ්.එම්.ඩී. විජේබණ්ඩාර මයා - සහකාර අධ්‍යක්ෂ |
| 04 | Diploma in English for Junior Executives (DEJE) | මිලෝදා ආයතනය (Miloda) | 2017 ජුනි සිට (මාස 09 ) පාඨමාලාව හදාරමින් සිටී. | එම්.ඩී.එස්.එස්. වීරසිංහ මිය |
| 05 | කාර්යාල කාර්ය සහයකයින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම | SDFL | 2017.06.22 - 23 | ජේ.ඒ.ජී.එන්. ජයකොඩි මයා<br><br>ඕ.කේ.ටී. තිලංක මයා |
| 06 | CIGAS Training | මිලෝදා ආයතනය (Miloda) | 2017.07.11 – 13 | එම්.ජී.එන්.එස්. මීගස්මුල්ල මිය<br><br>එම්.ඩබ්.ඒ.එස්. ශාන්තමාලි මිය<br><br>එම්.ජී.එන්.එස්. ගලප්පත්ති මයා |
| 07 | Diploma in English for Junior Executives (DEJE) | මිලෝදා ආයතනය (Miloda) | 2017 ඔක්තොම්බර් සිට (මාස 09 ) පාඨමාලාව හදාරමින් සිටී | ජී.එම්.ඒ.එස්.ගලප්පත්ති මයා |

### 4.3.3 2018 වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම්

01. දැනට නිකුත් කර ඇති කළමනාකරණ විගණන චක්‍රලේඛ යාවත්කාලීන කිරීම.

02. දැනට සිදුකරනු ලබන කාර්යයන්, පළාත් සභා සහ පළාත් පාලන ආයතන දක්වා පුළුල් කිරීම සහ ඒවායේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම හා විගණන හා කළමනාකරණ කමිටු මෙහෙයවීම පිණිස අවශ්‍ය ප්‍රතිපත්තිමය රාමුව සකස් කිරීම.

03. අමාත්‍යාංශ හා විශේෂ දෙපාර්තමේන්තුවල පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටුවලට අදාල වාර්තා සම්බන්ධයෙන් සාරාංශ සටහනක් අදාල පරිදි පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

04. අමාත්‍යාංශ හා විශේෂ දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/ අභ්‍යන්තර විගණකවරුන් ඇගයීමට ලක් කිරීම.

05. ප්‍රසම්පාදනය පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම පිණිස විගණන චක්‍රලේඛයක් නිකුත් කිරීම.

06. දේශීය මූල්‍යනය පාදක කරගත් ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර පාලනයට අදාලව පරීක්ෂා සටහනක් නිකුත් කිරීම.

07. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/ අභ්‍යන්තර විගණකවරුන් සහ සහාය කාර්යය මණ්ඩලය සඳහා වූ පුහුණු වැඩසටහන්

    I. විගණන නිලධාරීන් සඳහා වූ සහතික පත්‍ර පාඨමාලාව

    II. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සඳහා වූ විදේශීය පුහුණු වැඩසටහන
    (වැඩසටහන් 02 )